# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2495/57 - 2026 ජූලි මස 03 වැනි සිකුරාදා - 2026.07.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 වන අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1)(ආ) වගන්තිය යටතේ**
**මන්මුනෙයි පත්තු ප්‍රාදේශීය සභාවේ**
**සභික ධූරයේ පුරප්පාඩුවක් පිරවීම**

ඉල්ලා අස්වීම හේතුකොට ගෙන මන්මුනෙයි පත්තු ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකුගේ ධූරයක් පුරප්පාඩු වී ඇති හෙයින්ද;

ඉහත කී ආඥාපනතේ 66අ(1)(ආ) වගන්තිය යටතේ මන්මුනෙයි පත්තු ප්‍රාදේශීය සභාව සඳහා තෝරා එවා ඇති සභිකයෙකු ලෙස පත්වූ අලියාර් මොහමඩ් රෆික් මහතා අයත් වන්නා වූ එක්සත් ජාතික සන්ධානය නම්වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වන අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතුයැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම මන්මුනෙයි පත්තු ප්‍රාදේශීය සභාව සඳහා තෝරා එවිය යුතු සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා මුහම්මදු ඉස්මායිල් මුහම්මදු පර්හාත් මහතා නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද;

මන්මුනෙයි පත්තු ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී නාගලිංගම් රේගන් වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වන අධිකාරය) 66අ (1)(ආ) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින් මුහම්මදු ඉස්මායිල් මුහම්මදු පර්හාත් මහතා, මන්මුනෙයි පත්තු ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකු ලෙස මෙයින් ප්‍රකාශ කරමි.

**නාගලිංගම් රේගන්,**
තේරීම්භාර නිලධාරී,
මන්මුනෙයි පත්තු ප්‍රාදේශීය සභාව.

2026 ජූලි මස 03 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
මඩකලපුව

EOG 07 - 0069

1A - PG 7783 — 04 (2026/07) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*